බලංගොඩ අධ්‍යාපන කලාපය
பலாங்கொடை கல்வி வலயம்
Balangoda Education Zone

| 10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය -- 2025 | ඉතිහාසය |
|---|---|---|
| කාලය - පැය එකයි | | I - පත්‍රය |

උපදෙස්
*සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.
*අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
*ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.
*එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස්ද සැළකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1) පුරාණ කාලයට අයත් සාහිත්‍යය , ආගමික තොරතුරු හා වංශකතා ලිය වී තිබෙන්නේ ?
I ) තඹ පත්වලය II) පුස්කොළ පොත්වලය
III )රන් පත්වලය IV) සෙල්ලිපිවලය

2) මෙරට ශාසන ඉතිහාසය පිළිබඳව ලියවී ඇති කෘතිය වන්නේ මින් කුමක් ද ?
I) රාජාවලිය II) සීතාවක හටන III) නිකාය සංග්‍රහය IV) පැරකුම්බා සිරිත

3) ලංකාවට පැමිණ මෙහි ඇති තතු දැක බලා ඒ පිළිබඳව වාර්තා තබන ලද කතුවරයෙකු වන්නේ මින් කවුරුන්ද?
I) ඇරිස්ටෝටල් II) හියුං සියැං හිමි III ) ටොලමි Iv) ඉබන් බතූතා

4) මෙරටින් හමුවන පැරණිතම කාසි හදුන්වන්නේ කුමන නමින්ද ?
I) කහපන II) ලක්ෂ්මි කාසි III) මස්ස කාසි Iv) රෝම කාසි

5) විවිධ ප්‍රදේශවල දක්නට ලැබෙන ඉර හද රූප, වටාපොත, දුන්න, ඊතලය ආදී රූප සටහන්වලින් නිරූපණය කර ඇත්තේ මොනවාද ?
I)නිදන් සලකුණු II)පැරණි ප්‍රාදේශිය මායිම්
III)මාර්ග සළකුණු Iv)ආගමික සිද්ධස්ථාන බව

6) මෙරට ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පහතරට තෙත් කලාපිය ලෙන් වාසස්ථාන, වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන හා පහතරට වියළි කලාපිය ලෙන් වාසස්ථාන නිවරදි අනුපිළිවෙළට සඳහන් වන පිළිතුර තෝරන්න.
I) පොතාන, මිනිහාගල් කන්ද, පාහියන්ගල II) පාහියන්ගල, මිනිහාගල්කන්ද, පොතාන
III) පාහියන්ගල, පොතාන, මිනිහාගල්කන්ද Iv) පොතාන, පාහියන්ගල, මිනිහාගල්කන්ද

7) මෙරට ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ ශරීර ස්වාභාවය සම්බන්ධයෙන් නිවරදි ප්‍රකාශය කුමක්ද
I)කාන්තාවකගේ සාමන්‍යය උස 174 cm කි
II)එකල මිනිසුන්ගේ උපරිම ආයු කාලය වසර 50-55 පමණ වේ
III)වැඩිහිටි පිරිමියෙකුගේ මොළයේ විශාලත්වය ඝන සෙන්ටිමීටර් 920 කි
iv) ඔවුන්ට පළල් නාසයක් සහ නිකටක් විය

EXAMRESULTS.LK

8) පූර්ව ඓතිහාසික යුගයට අයත් මැටි ඔරු සුසාන සම්බන්ධ සාධක හමුවන ස්ථානය කුමක් ද?
I)යටිගල්පොත්ත II) ඉබ්බන්කඩුව Iii) හල්දුම්මුල්ල Iv) පොම්පරිප්පු

9) පූර්ව ඓතිහාසික යුගයේදී මැටි කර්මාන්තයේ දී යොදා ගත් සරල උපකරණය කුමක්ද
I)කිණිහිර II ) සකපෝරුව III) මයිනහම Iv) කෝව

10) මුල් ඓතිහාසික යුගයේ දී ගංගා නිම්නවලින් පිටත ප්‍රදේශයේ ජනාවාස පිහිටුවීමට බලපෑ හේතුව කුමක්ද
I)වී වගාව ප්‍රධාන ජීවනෝපාය වීම II) වගා කටයුතු සඳහා වැසි ජලය ප්‍රමාණවත් නොවීම
III)දියුණු වාරි පද්ධතියක් බිහිවී තිබීම Iv)විනාශකාරී ගංවතුර පාලනය කිරීමට දැනුමක් නොවීම

11) පහත A තීරයෙහි ජනාවාස වර්ගය සහ B තීරයෙහි ඊට පැවරී තිබූ කාර්‍යය දැක්වේ .එම තීර දෙක නිවරදිව ගැලපූ විට ලැබෙන් පිළිතුර කුමක්ද

| A තීරය | B තීරය |
|---|---|
| 1. කසීකාර ගාම | A ධීවරයින් විසූ ගම් |
| 2. කේවට්ට ගාම | B වඩුවන් විසූ ගම් |
| 3. වඩ්ඪකී ගාම | C වරාය ආශ්‍රිත ගම් |
| 4. පට්ටන ගාම | D ගොවියන් විසූ ගම් |

I) DABC II) ADBC III) BCAD Iv) ABDC

12) ''තොටබොජක'' යන වචනය සඳහන් සෙල්ලිපිය පහත පිළිතුරු අතරින් තෝරන්න
I) කළුදියපොකුණ ලිපිය II) කොත්ගල් කන්ද ලිපිය
III) බුද්ධන්නේහෙල ලිපිය Iv) පෙරියපුලියන්කුලම ලිපිය

13) ගම්කයින් ගෘහපතීන් අතරින් ම පත් වූ කෙනෙකු බව සමන්තපාසාදිකාවේ සඳහන් වේ. එම කෘතිය රචනා කර ඇත්තේ කවුරුන්ද?
i) බුද්ධඝෝෂ හිමියන් II) පාහියන් හිමියන් III) බුද්ධපුත්‍ර හිමියන් Iv) ධර්මසේන හිමියන්

14) ඓතිහාසික මූලාශවලට අනුව අනුරාධපුර රාජධානිය ගොඩනගන ලද්දේ කුමන රජු විසින් ද ?
I) ඉළනාග රජු II) දේවානම්පියතිස්ස රජු III) දුටුගැමුණු රජු Iv) පණ්ඩුකාභය රජු

15) භාතිකාභය රජු විසින් වීදුරු පබළු රැගෙන ඒම සඳහා දූතයින් පිටත්කර ඇත්තේ කුමන රටටද ?
i )චීනයට II) රෝමයට III)ඉන්දියාවට Iv) ඊජිප්තුවට

16) දඹුලු පර්වත ලිපියට අනුව කූටකණ්ණ අභය රජතුමා හඳුන්වා ඇත්තේ කුමන විරුද නාමයෙන් ද ?
I) අලකපය මහරජ II)චක්‍රවර්ති III)බෝධිසත්ව iv)නරඉසෙර

17) මෙරට ඉතිහාසයේ පළමුවරට සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය දෙන ලද්දේ කුමන රජතුමා විසින් ද ?
I) වසභ රජු II)කාශ්‍යප රජු III) දුටුගැමුණු රජු Iv)විජයභාහු රජු

A - කුඩා කළ දුෂ්කර ජීවිතයක් ගත කිරිම
B-චෝළයින් පරාජය කිරිම
C-නව රාජධානියන් ආරම්භ කිරිම

18) ඉහත තොරතුරු හා සම්බන්ධ පාලකයා කවුරුන්ද ?
I ) නිශ්ශංක රජු Ii) වසභ රජු III) පරාක්‍රමභාහු රජු Iv) පළවන විජයබාහු රජු

19) පැරණි සෙල්ලිපිවල සභාව යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමක්ද ?
I)රාජ සභාව II) අධිකරණය III) ව්‍යවස්ථාදායකය Iv) විධායකය

20) පත්තිනි දේවාලයක් විවෘත කිරිමේ උත්සවයකට සහභාගි විම සඳහා දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයට පැමිණි බව සඳහන් වන පාලකයා කවුරුන්ද ?

I) පළමුවන ගජබා රජු
II) හතරවන කාශ්‍යපප රජු
III) පස්වන මහින්ද රජු
Iv) හයවන අග්බෝ රජු

21) අතීතයේ දී හේන් හැඳින්වීම සඳහා පිටිබිම් යන වචනය භාවිතා කර ඇත්තේ කුමන මූලාශ්‍රවලද

I) බුත්සරන
II) සිංහල උම්මග්ග ජාතකය
IIi)සෙල්ලිපි
Iv) රසවාහිනිය

22) කාලයක් අතහැර දමා යළි වගා කිරිම අරඹන හේන හැඳින්වීම ට අනුරාධපුර පළාතේ ගැමියන් භාවිතා කළ වචනය කුමක්ද

I)නවදලි හේන
II) එල්ලංගාව
III)කෙටු කනබ
III)කනත්ත

23) මෙරට මුල් ම අවධියේ දි ඉදිකරන ලද කටාරම් හා සෙල් ලිපි කොටන ලද ගල් ගුහා බහුලව දක්නට ලැබෙන ස්ථානයක් නොවන්නේ

I) මිහින්තලය
II)වෙස්සගිරිය
III)තිරියාය
iv)සීගිරිය

24) මාතොට වරායට සමිපව ඉදිකොට තිබූ පැරණි හින්දූ දේවාලය කුමක්ද

I) කෝනේශ්වරම් කෝවිල
II මුන්නේෂ්වරම් කෝවිල
III) නල්ලූර් කෝවිල
iv)තිරුකේතීශ්වරම් දේවාලය

25) පහත A තීරයෙහි වෙළෙන්දන් සහ B තීරයෙහි ඔවුන් පැමිණි රට දැක්වේ. එම තීර දෙක නිවරදිව ගැලපු විට ලැබෙන් පිළිතුර කුමක්ද

| A තීරය | B තීරය |
|---|---|
| I) කාම්බෝජවරු | A දකුණු ඉන්දියාව |
| ii) අයෝනියන්වරු | B මලය අර්ධද්වීපය |
| iii) දෙමළ වෙළෙන්දෝ | C ඇෆ්ගනිස්තානය |
| iv) ජාවකවරු | D ග්‍රීක හා මැසිඩෝනියානු ප්‍රදේශ |

ඉහත A හා B තීරු නිවරදිව ගැලපු විට ලැබෙන ප්‍රකාශය කුමක්ද ,

I)C D A B
II) DC A B
III) AB DC
Iv) BA CD

26) චේර යොදා බලයක් යෙදිමෙන් ගල්පතුරු ගලවාගෙන මෙවලම් තැනිමේ තාක්ෂණය හැඳින්විමට යොදන පදය කුමක්ද

I)වජු චුම්බට
II)දියකැට පහන
Iii)පීඩන ශල්කනය
Iv) අවල ජල විද්‍යාව

27) ඇළ හැර ඇළ මගින් ජලය සපයන ලද වැව් අතරට අයත් නොවන වැව කුමක්ද

I) මින්නේරිය වැව
II)කලා වැව
III) ගිරිතලේ වැව
IV)කවුඩුල්ල වැව

28) වංශකතාවලට අනුව රෝහල් 18 ක් ඉදි කිරන ලද පාලකයා කවුරුන්ද ?

I) දුටුගැමුණු රජු
II)බුද්ධදාස රජු
III)පණ්ඩුකාභය රජු
Iv)භාතිකාභය රජු

29) මෙරට මැටි කර්මාන්තය ඉතා දියුණු මට්ටමකින් පැවති බව තහවුරු කරන වර්ණාලිප්ත උළු සම්බන්ධ සාධක හඳුනාගෙන ඇත්තේ කුමන ස්ථානයකින් ද ?

I) අභයගිරිය
II) ලෝහ ප්‍රාසාදය
III) රුවන්වැලිසැය
iv ) මිහින්තලය

30) අතීතයේදී කෙටි දුර මැනීම සදහා යොදාගත් මිමි ක්‍රමය මේ අතරින් කුමක්ද
I)ගව්ව II) යොදුන III) පරමාණු Iv) උසබ

31) පැරණි යුගයේ දී මාර්ගවල ගාවුත කණු සිටුවීම නියෝග කරන ලද්දේ කුමන රජු විසින් ද?
I)විජයබාහු රජු II) නිශ්ශංකමල්ල රජු III) පරාක්‍රමබාහු රජු Iv) බුවනෙකබාහු රජු

32) විශිෂ්ඨ නිර්මාණයක් වන දැදිගම ඇත් පහත නිර්මාණය කර ඇත්තේ කුමන ලෝහයෙන් ද
I) පිත්තල II) රිදී III) තඹ iv) ලෝකඩ

33) අතීත සෙල්ලිපිවල කුඩීන් යනුවෙන් හදුන්වා ඇත්තේ කවුරුන්ද ?
I) ගුරුවරුන් II) රාජකීයන්
III) සාමාන්‍යය ජනයා Iv) දාසයින්

34) කාසි අච්චු ගැසීම භාරව සිටි නිළධාරියා සෙල්ලිපිවල හදුන්වා ඇත්තේ කුමන නමින්ද ?
I) රූපදක II)දකපති
III) පනඅදෙක Iv) බඩගරික

35) අතීතයේදී තෙවරක් රට පාලනය කළ කාන්තාව ලෙස සදහන් වන රැජින කවුරුන්ද ?
I)චූල සීවලී II)සුමනා
III) අශෝකමාලා Iv) ලීලාවතී

36) ධානය වර්ග බැද කුඩු කොට සාදා ගන්නා ආහාර අතීතයේදී හදුන්වා ඇත්තේ කුමන නමින්ද
I)අත්සුණු II)තිලසංගුලිකා
III) කාඩි ඇඹුල Iv) යාගු

37) පැරණි ජනතාව විසින් සකස් කළ දියාරු නොවූ අතින් ගෙන අනුභව කළ හැකි පදමට සකස් කර ගත් ව්‍යංජනය හදුන්වන ලද නම කුමක්ද ?
I)නියඹලාව II)හොද්ද
III) බැදුම Iv) මැල්ලුම

38) ගෘහ දණ්ඩ යනු කුමක්ද
I) කිසිදු සතෙකු නොමැරිය යුතු බවට පැන වූ නීතිය
II) සැගව සිටින අපරාධකරු අල්ලා දෙන තුරු ගම්වැසියන් ගෙවූ බද්ද
III) පරිසරය ආරක්ෂා කර ගැනිමට පැන වූ බද්ද
Iv) මහාධිකරණයෙන් අය කළ දඩ මුදල

39) වර්තමාන ලංකාවේ භාවිතා වන නීතිය හදුන්වන්නේ කුමන නමින්ද?
I) රාජකීය නීතිය II) රෝම ලන්දේසි නිතිය
III)මාසාත නීතිය Iv)සිවිල් නීතිය

40) දෙවන නාගරීකරණයට අයත් රාජධානි පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න
I) අනුරාධපුරය, දඹදෙණිය, යාපහුව
II) පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව
III) අනුරාධපුරය, දඹදෙණිය, කුරුණෑගල
Iv) දඹදෙණිය, කුරුණෑගල, යාපහුව

**බලංගොඩ අධ්‍යාපන කලාපය**
**பலாங்கொடை கல்வி வலயம்**
Balangoda Education Zone

| 10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය -- 2025 | ඉතිහාසය |
| --- | --- | --- |
| කාලය - පැය තුනයි | | II - පත්‍රය |

උපදෙස්

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද ,III කොටසකින් ප්‍රශ්න එකකටද පිළිතුරු සපයන්න
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06කි.

## I කොටස


01) (අ). ( I ) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම ලංකා සිතියමෙහි ද, II යටතේ දක්වා ඇති සියල්ල ලෝක සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

I ) අනුරාධපුරය, වළවේ ගඟ, මිහිඟල් කන්ද, පොළොන්නරුව, ගිම්හ තිත්ථ, මින්නේරිය වැව, පොතාන, බෙල්ලන්බැදිපැලැස්ස, ජම්බුකෝල පට්ටන, ඉරණමඩු වැව, ත්‍රිකුණාමලය, දැදුරු ඔය (ල 12)

II ) ජපානය, රෝමය, කොන්ස්තන්තිනෝපල්, රතු මුහුද, ගෝව, බතාවිය (ල 06)

ආ) පහත A හා B පින්තූර අධ්‍යනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A



1) A රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2) එය කරවන ලද රජතුමා කවුරුන්ද ?
3) මෙය පිරිනමන ලද්දේ කාටද ?
4) මේ සඳහා භාවිතා කර ඇති මාධ්‍යය කුමක්ද?

B



1) B රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2) එය පිහිටා ඇති නගරය කුමක්ද ?
3) මෙය කුමන ආගම හා සම්බන්ධ ද?
4) මෙම ගොඩනැගිල්ල මගින් ප්‍රකට වන ඓතිහාසික කරුණ කුමක්ද?

III ) පහත A, B, C හා D යටතේ දක්වා ඇති පශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A මහාවංශයේ කතුවරයා කවුද

B වසභ රජු කළ නාගදීපය පාලනය කළ ඇමතිවරයා කවුරුන්ද ?

C ශ්‍රී ලංකාව ජනාවාස කළ ආදි මානවයා කවුරුද ?

D සූතිඝර චෛත්‍යය ඉදිකරවන ලද රජතුමා කවුද ? (ල 4)

## II කොටස

02) I)ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් ඉන්දියාවේ රචිත කෘති තුනක් ලියන්න (ල3)

II) ඉතිහාසය ගොඩනගා ගැනිමට සාහිත්‍යය මූලාශ්‍ර යොදා ගැනිමේ දී සැළකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න. (ල4)

III)පුරා විද්‍යාත්මකව මූලාශ්‍ර මිනිස් ක්‍රියාකාරකම් මගින් විනාශ වන අවස්ථා දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල5)

Iv )මෙරට ඉතිහාසය හැදෑරීමේ දී චිත්‍ර, මූර්ති හා පුරා වස්තුවල වැදගත්කම කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ල6)

03) I ) ප්‍රාග් මානවයා පිෂ්ඨය ලබා ගැනිම සදහා පරිභෝජනය කළ ආහාර වර්ග තුනක් ලියන්න (ල3)

II)ප්‍රාග් ඓතිහාසික මහානවයා වසය කළ තෙත් කලාපීය ලෙන් දෙකක් හා වෙරළාශ්‍රිත වාසස්ථාන දෙකක් බැගින් ලියන්න (ල4)

III) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ අභිචාර විධි පිළිබදව කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න (ල5)

IV)ප්‍රාග් ඓතිහාසික යුගය හා සසදන විට පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණික දියුණුව පිළිබද උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න (ල6)

04) I) මුල් ඓතිහාසික යුගය වන විට මෙරට පරිපාලනය ක්‍රමවත්ව පැවති බවට සාධක වූ තනතුරු නාම තුනක් ලියන්න (ල 3)

II)පූර්ව ඓතිහාසික යුගයේ අනුගමනය කරන ලද සුසාන වාරිත්‍ර දෙකක් ලියා ඒවායේ සාධක හමුවන ස්ථානය බැගින් ලියන්න ( ල4)

III මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක දෙකක් ලියා පැහැදිලි කරන්න ( ල5)

IV) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසයන්හි ස්වරූපය ගම, නගර, පුර යන මාතෘකා ඔස්සේ පැහැදිලි කරන්න (ල 6)

05) I) පූර්ව රාජ්‍ය සමයේ දී පරුමකවරුන් විවිධ අවස්ථාවල ඔවුන් හදුන්වාගත් නම් තුනක් ලියන්න (ල3)

Ii )මධ්‍යගත පාලනයට අයත් පහත නිළධාරින්ගේ නිල නාමය වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියා දක්වන්න

a) භාණ්ඩාගාරික
b) භෝජන ශාලා අධිකාරී
c) නගර පරිපාලන
d) රාජ්‍ය ලේඛණාගාර ප්‍රධානි

(නගර ගුතික, බඩගරික, කනපෙඩික, පණ අදෙක, බතගු, කොතුරුගැනා) (ල4)

Iii) පණ්ඩුකාභය රජු මෙරට ප්‍රථම රජු ලෙස සැළකීමට හේතු වූ සාධක දෙකක් මගින් විස්තර කරන්න (ල5)

Iv)දුටුගැමුණු රජුගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු තුනක් ඇසුරින් අගය කරන්න (ල6)

06) I )අතීත ලංකාවේ පැවති වෘත්තීන් තුනක් ලියන්න (ල3)

II ) විජයබාහු රජුගේ විදේශ සබඳතා සඳහා උදාහරණ දෙකක් ලියන්න (ල4)

III) අනුරාධපුර යුගයේ මෙරට පැවති අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න (ල5)

IV) අතීත සමාජයේ මෙරට ජනතාව වාර්ගික සහජීවනයකින් යුක්තව ජීවත් වූ බව උදාහාරණ තුනක් මගින් පැහැදිලි කරන්න (ල6)

07) I) අතීතයේ අවකාශය මැනීම සඳහා භාවිතා කළ මිනුම් තුන ලියන්න (ල3)

II) පිළිතුරු සපයන්න

a) "අහසින් වැටෙන එක වැහි බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යා නොදිය යුතු ය " මෙම අදහස දැරූ රජතුමා

b) ක්‍රි.ව 2 සියවසට අයත් සෙල් ලිපි අනුව ඇළ මාර්ග ඉදි කිරිම සම්බන්ධයෙන් කටයුතු කළ නිළධාරියා

C) පතිය ජලයේ කිවුල් බව මග හරවා ගැනිමට විශාල ප්‍රමාණයේ මැටි බඳුන් මගින් ළිං බිත්ති ආවරණය කර තැනූ ළිද හඳුන්වන නම

D) අකුණු සැර මගින් ආරක්ෂා වීමට විශාල ස්තූප මුදුනේ සවිකළ උපකරණය (ල4)

III) පුරාණයේ සිට මෙරට යකඩ නිස්සාරණ තාක්ෂණය පැවති බවට සාධක ලෙස උදුන් හමු වූ ස්ථාන දෙකක් නම් කර ඒවායෙහි යකඩ නිස්සාරණ ක්‍රියාවලිය සිදු කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න (ල5)

Iv )මහ වැව් තැනීමක් යනු විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම් සම්භාරයක ප්‍රතිඵලයකි .වැවක අංග තුනක් උදාහාරණ ලෙස ගෙන මෙම කියමන සනාථ කරන්න (ල6)

08) I) බදු නීතිය යටතේ අය කළ ප්‍රධාන බදු වර්ග තුනක් නම් කරන්න (ල3)

II)පහත සඳහන් නීති හා සම්බන්ධ සෙල් ලිපිය වරහන් තුළින් තෝරා ලියන්න

a)මී හරකන් ,එළ හරකන් ,එළුවන්,ඝාතනය කරන්නන්ට මරණ දඬුවම

b)පොහොය දිනට වෙළඳාම තහනම්

C)සොරකම් ,මිනීමැරුම් සඳහා දිය යුතු දඬුවම්


d)නිසි කාලයට සී සෑම් නොකිරිම සම්බන්ධ නීති

(වෙවැල්කැටිය ලිපිය, බදුලු ටැම් ලිපිය, කොණ්ඩවට්ටාන් ටැම් ලිපිය ,වෙස්සගිරියේ ලිපිය ,මිහින්තලා පුවරු ලිපිය ) (ල4)

III) අපේ පැරණි රජවරු පරිසරය ආරක්ෂා කිරිමට ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියා පැහැදිලි කරන්න (ල5)

Iv) ලෙඩ රෝග වලින් තොරව වාසය කිරිම සඳහා අතීත ආහාර රටාවෙන් අපට ගත හැකි ආදර්ශ තුනක් ලියා පැහැදිලි කරන්න (ල6)

ඇ (I)



ආ(II)

